

# කොමඩු වගාව



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි



**විෂය උපදේශක මඬුල්ල**

එච්. සමරතුංග

ඒ.ආර්.එම්. මහරුෆ්

**සංශෝධිත දෙවන මුද්‍රණය (2008)**

එස්.ජී. පියදස

එල්.පී. සෝමදස

ඩී.එම්.කේ. රම්‍යලතා

**රචනය හා සංස්කරණය**

කේ.එන්. මාන්කෝට්ටේ

**සැකසුම**

ආර්.එම්. සංජීවනී කුමාරි ගුණතිලක

**චිත්‍ර**

ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය

ගන්නෝරුව

**මුද්‍රණය**

කෘෂිකර්ම මුද්‍රණාලය

ගන්නෝරුව

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**පේරාදෙණිය**

**2008**

# කොමඩු

කුකර්බිටේසී කුලයට අයත් කොමඩු, අප්‍රිකානු මහාද්වීපයේ සම්භවය වු භෝගයක් ලෙස සැලකේ. උද්භිද විද්‍යාත්මකව එය හඳුන්වනු ලබන්නේ **කුකුමිස් මෙලෝ** නමිනි. කෙටි කලකදී අස්වනු ලබාදීම, වගා වියදම අඩුවීම හා වියළි හා අතරමැද කලාප වල පහසුවෙන් වගාකළ හැකිවීම නිසා ගොවීන් අතර මෙය ජනප්‍රිය වාණිජ වගාවක් බවට පත්ව තිබේ.

අප රටේ වගා කරනු ලබන කොමඩු වගී සඳහා යුරෝපය, ජපානය හා නෙදර්ලන්තය වැනි රටවල විශාල ඉල්ලුමක් පවතී. අපනයනය සඳහා වගා කරන්නේ නම් අදාල රටේ ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි ගෙඩිවල ගුණාත්මය පැවතිය යුතුය.

ශ්‍රී ලංකාවේ මහවැලි ව්‍යාපාරය ඇතුළු වියළි කලාපීය ප්‍රදේශ වල කොමඩු වගාව ව්‍යාප්ත කිරීම සඳහා විශාල හැකියාවක් තිබේ. කොමඩු වගාකරනු ලබන දිස්ත්‍රික්ක අතුරින් ප්‍රධාන තැනක් ගන්නේ මොනරාගල හා පුත්තලමයි.

## පෝෂණීය අගය

ඉදුණු කොමඩු මදයේ ග්‍රෑම් 100 ක අඩංගු ද්‍රව්‍ය

| | | | |
|---|---|---|---|
| ජලය | - | ග්‍රෑම් | 95.8 |
| ශක්තිය | - | කි.කැලරි | 16.0 |
| ප්‍රෝටීන් | - | ග්‍රෑම් | 0.2 |
| මේදය | - | ග්‍රෑම් | 0.2 |
| කාබොහයිඩ්‍රේට් | - | ග්‍රෑම් | 3.3 |
| කැල්සියම් | - | මි.ග්‍රෑම් | 11.0 |
| පොස්පරස් | - | මි.ග්‍රෑම් | 12.0 |
| යකඩ | - | මි.ග්‍රෑම් | 7.9 |
| තයමින් | - | මයික්‍රො ග්‍රෑම් | 20.0 |
| රයිබොෆ්ලේවින් | - | මයික්‍රො ග්‍රෑම් | 40.0 |
| නයසින් | - | මි.ග්‍රෑම් | 0.1 |
| විටමින් සී | - | මි.ග්‍රෑම් | 1.0 |

කොමඩු වගී අළුත් පළතුරක් ලෙස වඩා ජනප්‍රියය. එය පලතුරු සලාද සඳහා ද යොදා ගැනේ. එසේම විශේෂයෙන් අප රටේ බහුලව දක්නට ලැබෙන කොමඩු වගී පිපාසිත අවස්ථාවන්හිදී ආහාරයට ගැනීමට වැඩි දෙනා ප්‍රිය කරති.

දැනට ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තු කර ඇති කොමඩු වගා වපසරිය හෙක්ටයාර් 300 පමණ වේ.

## දේශගුණික අවශ්‍යතා

ප්‍රධාන වශයෙන් අප රටේ වියළි කලාපයේ ද, අතර මැද කලාපයට අයත් බොහෝ ප්‍රදේශ වල ද කොමඩු වගාව සඳහා සුදුසු දේශගුණික තත්ත්ව පවතී. පරිසර උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 20 ට අඩු උෂ්ණත්වයක් පවතින ප්‍රදේශ වගාව සඳහා සුදුසු නැත. එනිසා අධික ශීතල දේශගුණය මෙන්ම තෙත් බව වැඩි ප්‍රදේශ ද වගාව සඳහා සුදුසු නොවේ. වර්ෂාව අධික ප්‍රදේශයන්හි පත්‍ර, මුල් හා ගෙඩි වලට වැළදෙන නොයෙකුත් දිලීර රෝග නිසා වගාව පහසුවෙන් විනාශ විය හැකිය.

හොඳින් හිරු එළිය ලැබෙන වියළි උණුසුම් කාලගුණික තත්ත්ව පැවතීම වගාවට ඉතා වැදගත්ය. භෝගයට වඩා යෝග්‍ය ආර්ද්‍රතාවය 65-75% පමණ වේ. වගාව සඳහා යල කන්නය වඩා සුදුසුය. මාස් කන්නයේදී තද වැසි අවසාන වු පසු වගාව ආරම්භ කළ හැකිය.

## පස

හොඳින් ජල වහනය වන කාබනික ද්‍රව්‍ය අඩංගු වැලි සහිත පසක් වගාව සඳහා ඉතා සුදුසුය. පසේ තිබිය යුතු වඩා යෝග්‍ය පී.එච්. අගය 5.5-7.0 පමණ වේ. කොමඩු ශාකයේ මුදුන් මුල එතරම් ශක්තිමත් නොවන නිසා මැටි සහිත පසෙහි වර්ධනය සතුටුදායක නොවේ.

## වගා කළ හැකි ප්‍රභේද

උද්භිද විද්‍යාත්මක ලක්ෂණ මත කොමඩු ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. පැණි කොමඩු (sweet melon) නමින් හඳුන්වනු ලබන්නේ වැඩි පැණි රසකින් යුතු වර්ගය. අප රටේ බෙහෙවින් දක්නට ලැබෙන පත්තක්කා හෝ කොමඩු (water melon) නමින් හැඳින්වෙන වර්ග රසයෙන් අඩුය. ඒවායේ මදයේ ඇති ජල ප්‍රමාණය ඉතා අධිකය. මස්ක් මෙලන්, රොක් මෙලන් සහ කැන්ටලූප් ආදිය පැණි කොමඩු ගණයට අයත්ය.

ශ්‍රී ලංකාවේ දැනට බෙහෙවින් ජනප්‍රිය වී ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කරන ලද කොමඩු වර්ගය **“තිළිණි”** නමින් හැඳින්වේ. මෙය "සුගර් බේබි" නැමති ප්‍රභේදයෙන් වරණය කරන ලද්දකි.



"තිළිණි" ප්‍රභේදය සෙසු වර්ග වලට වඩා හොඳින් වියළි තත්වයනට ඔරොත්තු දේ. තද කොළ පැහැති රවුම් හැඩති ගෙඩි, ප්‍රමාණයෙන් බොහෝදුරට ඒකාකාරය. ගෙඩියක බර කි. ග්‍රෑම් 2.5-3.0 පමණ වේ. හොඳින් මේරූ ගෙඩිවල මදය රසවත්ය. රෝස පාටට හුරු රතු පැහැතිය.

මෙහි සඳහන් කර ඇත්තේ පත්තක්කා හෙවත් කොමඩු (water melon) වගාව සඳහා අනුගමනය කළයුතු උපදෙස් මාලාවකි. මෙම වගා පිළිවෙත් පැණි කොමඩු වර්ග සඳහා ද උපයෝගී කරගත හැකිය.

## බීජ ලබා ගැනීම

තිළිණි කොමඩු ප්‍රභේදයේ බීජ වගා කර නැවත එම වර්ගයේ ලක්ෂණ සහිත පැළ හට ගන්නා බීජ නිපදවා ගත හැකිය. නමුත් ආනයනය කරනු ලබන දෙමුහුන් වර්ග වල කොමඩු බීජ වගා කළ හැක්කේ එක වරක් පමණකි. මෙවැනි වගාවක හට ගන්නා බීජ නැවත වගා කළ විට එකිනෙකින් බොහෝ සේ වෙනස් වන ලක්ෂණ සහිත ශාක හට ගනී.

## බිම් සැකසීම

පළමුව ඉඩමේ පස් සංරක්ෂණ කටයුතු පිළිබඳව සැලකිලිමත් වන්න. බිම කොටා හෝ සී සා කැට පොඩිකර ගන්න. ක්‍රමානුකූලව වගා කරන විට අවශ්‍ය අවස්ථා වලදී ජල සම්පාදනය කළයුතු නිසා එයට ගැලපෙන පරිදි මීටරයක පමණ පළල, උස් පාත්ති සකසා ගැනීම වඩා සුදුසුය.



සෙ.මී. 30×30×30 ප්‍රමාණයේ වලවල් කපා වියළි ගොම හෝ කොම්පෝස්ට් පොහොර යොදා පස සමග කලවම් කරන්න. බීජ සිටුවීමට දින 2 කට පමණ පෙර මූලික පොහොර වශයෙන් යෙදිය යුතු රසායනික පොහොර ද යොදා පසට කලවම් කරන්න.

## පරතරය

මීටර් 1 × මීටර් 1/2

මේ අනුව අක්කරයක් සඳහා වලවල් 8000 පමණ සකසාගත යුතුය. (හෙක්ටයාරයකට නම් වලවල් 20,000 පමණ අවශ්‍ය වේ.)



## බීජ අවශ්‍යතාවය

නොයෙක් කොමඩු වර්ගයන්හි බීජ වල විශාලත්වය වෙනස් වේ. එනිසා ග්‍රෑම් 450 ක බීජ 12,000 - 20,000 පමණ අඩංගු විය හැකිය. වගා කරනු ලබන ප්‍රභේදය අනුව අවශ්‍ය බීජ ප්‍රමාණය තීරණය කළ යුතුය.

හෙක්ටයාරයක් සඳහා තිළිණි ප්‍රභේදයේ බීජ කිලෝ ග්‍රෑම් 03 පමණ අවශ්‍ය වේ. මෙම ප්‍රභේදයේ බීජ ග්‍රෑම් 10 ක බීජ 200 පමණ අඩංගු වේ. මෙම ප්‍රභේදයේ ගෙඩියක බීජ 200 පමණ ඇත.

## සිටුවීම

පසේ වයනය, තෙතමනය හා කොමඩු වර්ගය අනුව බීජ සිටුවන ගැඹුර අඟල් 1/2 සිට අඟල් 01 පමණ දක්වා වෙනස් විය හැකිය.

සැහැල්ලු පසක බීජ ගැඹුරට සිටුවන්න. පසේ තෙතමනය අධික විටදී සහ ජල සම්පාදනය යටතේ දී බීජ සිටුවන ගැඹුර අඩු කරන්න. එසේම ප්‍රමාණයෙන් කුඩා බීජ සිටුවිය යුත්තේ ද අඩු ගැඹුරකිනි.

එක වලක බීජ 3-4 ක් බැගින් සිටුවන්න. එකිනෙකට තරමක් දුරින් වල තුල බීජ සිටුවිය යුතුය. මෙවිට වැඩි පැළ ගැලවීමේදී සෙසු පැළ වලට හානියක් සිදු නොවේ. පසේ උෂ්ණත්වය අනුව බීජ පැළවීමට ගතවන කාලය දින 7 - 10 පමණ වේ. පසේ උෂ්ණත්වය අඩුනම් බීජ පැළවීම සඳහා ගතවන කාලය ද වැඩි වේ. බීජ එකවරම ක්ෂේත්‍රයේ සිටුවීම නොකර, පළමුව කුඩා පොලිතීන් මළු වල සිටුවා පසුව ක්ෂේත්‍රයේ සිටුවීම ද කළ හැකිය. කටුස්සන් වැනි සතුන් ගෙන් බීජ වලට හානි ඇතිවීම මෙමගින් වලකී. වගා නඩත්තුව ද පහසුය.

## පැළ තුනී කිරීම

බීජ ප්‍රරෝහණයවී, දෙවන පත්‍රය හට ගෙන ඇති අවස්ථාවේ දී එක් වලක නිරෝගී පැළ දෙකක් ඉතිරි වන සේ වැඩි පැළ ගලවා ඉවත් කරන්න. දුර්වල හා රෝගී පැළ ද ඉවත් කරන්න. මෙම අවස්ථාවේදීම බීජ ප්‍රරෝහණය වී නැති වලවල් වල ද, නැවත බීජ සිටුවන්න.

පැළ ගලවා ඉවත් කිරීම අවස්ථා දෙකකදී සිදු කරන්න. සමහර කුඩා පැළ වලට කෘමීන්ගෙන් හානි සිදුවුවහොත් වගාවේ පැළ සංඛ්‍යාව අඩුවීමෙන් ඇතිවිය හැකි අවාසිය මෙමගින් මගහරවා ගත හැකිය.

## වල් පැළෑටි පාලනය

බීජ ප්‍රරෝහණය වීමට හෝ පැළ සිටුවීමට පෙර පූර්ව නිර්ගමන වල් නාශකයක් සකස් කරගත් ඉඩමට ඉසීමෙන් වල් පැළෑටි පාලනය පහසු වේ. එසේම වැල් වර්ධනය වීමට පෙර හා පළමු වල් මර්දනයෙන් පසුව පාත්ති මත අඟල් 4 පමණ ඝනකම ඇති පිදුරු තට්ටුවක් දැමීම ද සුදුසුය. මෙමගින් පසේ තෙතමනය ද ආරක්ෂා වේ.



වැල් දිවීම ආරම්භ වූ පසු, පාත්තිය ආවරණයවී වැඩෙන පරිදි වැල හැර වීමට පිළිවන. පාත්ති වැල් වලින් ආවරණය වූ පසු වල් පැළ වැඩීම ද අඩු වී යයි.

## පොහොර යෙදීම

කාබනික පොහොර අධික පස් වල කොමඩු ඉතා හොඳින් වැඩේ. එනිසා පැළ හෝ බීජ සිටුවීම සඳහා සකසන වලවල් වලට හැකිතාක් හොඳින් දිරාපත් වූ කාබනික පොහොර යෙදීම ඉතා සුදුසුය.

භෝගය සඳහා පහත සඳහන් ආකාරයට රසායනික පොහොර යොදන්න.

| | අක්කරයක් සඳහා කි.ග්‍රෑ. | | |
|---|---|---|---|
| | යූරියා | ත්‍රිත්ව සුපර් පොස්පේට් | මියුරියේට් ඔෆ් පොටෑෂ් |
| මූලික පොහොර (බීජ සිටුවීමට දින 2 පමණ පෙර) | 30 | 75 | 25 |
| සති 2 දී | 30 | - | 25 |
| සති 5 දී | 30 | - | 25 |

පැළයේ සිට සෙ.මී. 30 පමණ දුරින් වලයක ආකාරයට රසායනික පොහොර විසුරුවා අත් මුල්ලුවකින් පසට කළවම් කරන්න. රසායනික පොහොර යොදන විට පසෙහි තෙතමනය පැවතිය යුතුය. පොහොර යෙදීමෙන් පසු වගාවට ජලය සපයන්න.

## ජල සම්පාදනය

වේගවත් වර්ධනයක් සඳහා භෝගයේ මුල් අවධියේ දී පසේ තෙතමනය මැනවින් පවත්වා ගන්න. මෙය ඵල වර්ධනයට ද හිතකර ය. කෙසේ වුවද ඵල මෝරන අවධියේ දී ජල සැපයුම ක්‍රමයෙන් අඩු කර පසේ අනවශ්‍ය පරිදි තෙතමනය නොපවතින බවට වග බලා ගන්න.

පසේ වැලි ස්වභාවය අධික විටදී අඩු කාලාන්තර වලින් වගාවට ජලය සපයන්න.

## පරාගණය කිරීම



කොමඩු වැලක ආකාර දෙකකට අයත් මල් හට ගනී. වැලක ප්‍රථමයෙන් හට ගන්නේ පිරිමි මල්ය. පසුව හට ගන්නා ස්ත්‍රී ලිංගික හෙවත් ගැහැණු මල් වලින් ඵල ඇති වේ.

මල් හට ගැනීම ආරම්භ වන්නේ වගාවේ වයස දින 30 පමණ වූ විටය. මල් පාරාගණය ප්‍රධාන වශයෙන් කෘමින් මගින් සිදු වේ. මී මැස්සා මේ සඳහා ඉතා සුදුසු කෘමියෙකි. වෙනත් රට වලින් වාර්තා වන පරිදි අක්කරයක වගාවක පරාග පෝෂණය කිරීම සඳහා මී මැසි ජනපද දෙකක් ප්‍රමාණවත් වේ. පරාගනය හොඳින් සිදු නොවුනහොත් අස්වැන්න අඩු වේ.

වගාවේ හට ගන්නා ගෙඩිවල විශාලත්වය පාලනය කිරීම සඳහා ගෙඩි තුනී කරනු ලැබේ. අපනයන වෙළඳ පොළවල් සඳහා වගා කරන විට මෙය වඩා වැදගත්ය.

## කෘමි හා රෝග පාලනය

වගාවේ සාර්ථකත්වය සඳහා, කොමඩු වගාව සඳහා තෝරා ගත යුත්තේ එම කුලයටම අයත් වෙනත් භෝග යක් එයට පෙර කන්නයේ වගා නොකල ඉඩමකි. මෙමගින් කෘමි හා රෝග හානි වැඩිපුර වැළඳීමට ඇති ඉඩ ප්‍රස්ථා අඩු වේ. වට පණු හානිය විශාල වශයෙන් පවතින ඉඩම් ද වගාවට සුදුසු නැත.

## දියමලන් කෑම

මෙම රෝගය නිසා බීජ ප්‍රරෝහනය නොවේ. කුඩා බීජ පැළ මැරී යයි. මේ සඳහා සිටු වීමට පෙර බීජ සමඟ කැප්ටාන් හෝ තිරාම් වැනි දිලීර නාශකයක් මිශ්‍ර කරන්න.

## යටි පුස් රෝගය

එල හට ගන්නා අවස්ථාවේ ඇති වැල් වලට වැළඳිය හැකි දිලීර රෝගයකි. තෙත් කාලගුණයක් පවතින විට රෝගය දරුණු විය හැකිය. නමුත් එල වලට රෝගය නිසා හානියක් ඇති නොවේ. මේ සඳහා පහත සඳහන් නිර්දේශිත දිලීර නාශකයක් භාවිතා කරන්න.

| දිලිර නාශකය | ජලය ලිටර් 10 සමඟ මිශ්‍ර කළ යුතු ප්‍රමාණය (ග්‍රෑම්) |
|---|---|
| කැප්ටාන් 50% WP | 20 |
| කැප්ටාන් 80% WP | 12.5 |
| කැප්ටාන් 37.68% SC | මි.ලී. 20 |
| කොපර් 50% WP | 40 |
| කොපර් 37.5% DP | 50 |
| මැන්කොසෙබ් 80% WP | 20 |
| මැන්කොසෙබ් 75% WG | 20 |
| මැනෙබ් 80% WP | 20 |
| මැන්කොසෙබ් 64% + මෙටලැක්සිල් 8% WP | 12.5 |
| ප්‍රොපිනෙබ් 56% + ඔක්සඩික්සිල් 10% WP | 12.5 |
| ප්‍රොපිනෙබ් 70% WP | 20 |



## පිටිපුස් රෝගය

රෝග කාරක දිලීරය නිසා සුදු පැහැති ලප පත්‍ර මතුපිට හට ගනී. මෙම රෝගය වගාවට විශාල වශයෙන් වැළඳෙන බව තීරණය කළහොත් පහත සඳහන් නිර්දේශිත දිලීර නාශකයක් යොදන්න.

| දිලිර නාශකය | ජලය ලිටර් 10 සමඟ මිශ්‍ර කළ යුතු ප්‍රමාණය |
|---|---|
| බිටර්ටනෝල් 300g/l EC | මි.ලී. 10 |
| කාබෙන්ඩසිම් 50% WP/WG | ග්‍රෑම් 07 |
| කාබෙන්ඩසිම් 500 g/l SC | මි.ලී. 07 |
| ක්ලෝරොතැලොනිල් 75% WP | ග්‍රෑම් 20 |
| තයෝෆනේට් මීතයිල් 500 g/l SC | මි.ලී. 08 |
| තයෝෆනේට් මීතයිල් 70% WP | ග්‍රෑම් 06 |
| ක්ලෝරොතැලොනිල් 500 g /l SC | මි.ලී. 25-30 |
| සල්ෆර් 80% WP/WG | ග්‍රෑම් 50 |



## කළු ලප රෝගය

දිලීර රෝගයකි. කදේ කළු පැහැති ලප හට ගනී. ගෙඩි වලින් මැලියම් වෑස්සීමට පටන්ගනී. රෝගය වලක්වා ගැනීම සඳහා භෝග මාරුව සහ කැප්ටාන්, තිරාම් වැනි දිලීර නාශකයක් යොදා බීජ ප්‍රතිකාර කිරීම කළ හැකිය.

## බැක්ටීරියා කොළ අංගමාරය

අසාමාන්‍යාකාර හැඩයෙන් පත්‍ර වල කහ දුඹුරු ලප හටගනී. සම්පූර්ණ පත්‍රයම ක්‍රමයෙන් මැරී යා හැකිය. වැල ද විවිධ ස්ථාන වලින් මැරී යාමට ඉඩ තිබේ. පත්‍ර හැලී යාම නිසා වර්ධනය දුර්වල වී අස්වැන්න අඩු වේ. බීජ මගින් ද රෝගය පැතිරේ.

මෙම රෝගය පාලනය කිරීම සඳහා රෝගී පත්‍ර, වැල් ආදිය පුළුස්සා විනාශ කර දමන්න. වසර දෙකක් පමණ කාලයක්, කොමඩු හෝ වෙනත් එම කුලයට අයත් භෝගයක් හෝ අදල ඉඩමේ වගා කිරීමෙන් වලකින්න.

## පත්‍ර විචිත්‍ර වෛරස් රෝගය

පත්‍රවල කහ පැහැති විචිත්‍ර ස්වභාවයක් ඇති වී පසුව විකෘති වේ. රෝගී වැල්වල පත්‍ර කුඩා වේ. පර්ව අතර දුර අඩු වේ. ගෙඩි කුඩා වේ. රෝගය ව්‍යාප්ත වන්නේ කුඩිත්තන් මගිනි. රෝගී වැල් ගලවා ඉවත් කරන්න. මෙම රෝගය වැළඳී ඇති වෙනත් භෝග ආසන්නයේ කොමඩු වගා නොකරන්න.

## ඇන්ත්‍රැක්නෝස් රෝගය

දිලීර රෝගයකි. පත්‍රයේ නාරටි අසලින් කෝණාකාර හෝ රවුම් ලප හට ගනී. මෙම ලප අසලින් මැලියම් වැගිරේ. රෝගී පත්‍රවල වර්ධනය අඩු වී පසුව මිය යයි. රෝගී වගාවක් පිළිස්සුන ස්වභාවයක් පෙන්නුම් කරයි. රෝගී වගාවන්හි ගෙඩි වල ගිළුනු ලප ඇති වේ. ගෙඩි විකෘති වේ. බීජ හා ජලය මගින් රෝගය පැතිරේ. අවශ්‍ය අවස්ථාවලදී රෝගය පාලනය කිරීම සඳහා පහත සඳහන් නිර්දේශිත දිලීර නාශකයක් යොදන්න.

| දිලීර නාශකය | ජලය ලීටර් 10 සමඟ මිශ්‍ර කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ක්ලෝරොතැලොනිල් 75% WP | ග්‍රෑම් 20 |
| මැන්කොසෙබ් 80% WP | ග්‍රෑම් 20 |
| මැන්කොසෙබ් 75% WG | ග්‍රෑම් 20 |
| මැනෙබ් 80% WP | ග්‍රෑම් 20 |
| තයෝෆනේට් මීතයිල් 70% WP | ග්‍රෑම් 06 |
| කාබෙන්ඩයිම් 50% WP/WG | ග්‍රෑම් 07 |
| කාබෙන්ඩසිම් 500 g/l SC | මි.ලී. 07 |
| තයබෙන්ඩසොල් 45% WG | ග්‍රෑම් 20 |
| ක්ලෝරොතැලොනිල් 500 g /l SC | මි.ලී. 25-30 |
| ෆ්ලුසිලසෝල් 400g/l EC | මි.ලී. 08 |
| ප්‍රොපිකොනසෝල් 250 g /l EC | මි.ලී. 10 |
| පයිරක්ලොක්ට්‍රොබින් 500 g /l EC | මි.ලී. 08 |

## මුල ගැට වටපණු හානිය

වටපණු හානිය නිසා මුල් අසාමාන්‍ය ලෙස මහත් වී ගැටිති ඇති වේ. මෙමගින් පැළ දුර්වල වේ. පරිසර උෂ්ණත්වය වැඩි කාල වලදී පැළ විගසින් මලානික වේ. භෝග මාරුව මගින් ද, බීජ සිටුවීමට සතියකට පමණ පෙර, සකසා ගත් වලවල් වලට කුකුල් පොහොර යොදා කළවම් කර, ජලය සපයා, පසුව බීජ සිටුවීමෙන්ද වටපණු හානිය පාලනය කර ගත හැකිය.

**කොමඩු වලට හානි කළ හැකි කෘමින් ද, මෙම කුලයට අයත් පතෝල, කරවිල, පිපිඤ්ඤා වැනි භෝගවලට හානි කරනු ලබන කෘමින්මය.** ඒ නිසා කෘමි පාලනය සඳහා පියවර ගත යුත්තේ ද එම භෝගවල කෘමි පාලන පිළිවෙත් වලට ගැලපෙන පරිද්දෙනි.

## අස්වැන්න නෙලීම

සියළුම කොමඩු වගී වල ඵල නෙලාගත යුත්තේ ඒවා හොඳින් මේරූ පසුවය. **ඵල නෙලා ගැනීමෙන් පසුව තවදුරටත් එහි සීනි ප්‍රමාණය වැඩි නොවේ.** නිසි ලෙස මෝරා නැති ඵල වල, මදයේ පැහැය හා රසය ඉතා දුර්වල තත්ත්වයක පවතී.

තිළිණි කොමඩු ප්‍රභේදයේ ගෙඩි නෙලා ගත යුත්තේ ගෙඩිය මත අළු පැහැති ස්වභාවයක් ඇති වීමට පටන් ගත් පසුවය.

මෙයට අමතරව ගෙඩියේ පොත්ත තද කොළ පැහැයක් ගැනීම, තට්ටු කළ විට නැගෙන බොල් හඬ සහ ගෙඩිය පොළවට ස්පර්ශවන ස්ථානය කහ පැහැයකට හැරීම ආදී ලක්ෂණ ද ගෙඩිය මෝරා ඇති බව නිගමනය කළ හැකි සෙසු සාධක වේ.

තිළිණි කොමඩු ප්‍රභේදය සිටුවා දින 75-80 දී පළමු අස්වැන්න නෙලාගත හැකිය. සිටුවා දින 100-110 දී පමණ අවසාන අස්වැන්න නෙලාගත හැකිය.

කැන්ටලුප් ගෙඩි නෙලාගත යුත්තේ ගෙඩිය වැලෙන් ගැලවීමට ආසන්න විටදීය. මේ අවස්ථාවේදී ගෙඩිය පහසුවෙන් වැලෙන් ගැලවිය හැකිය. එසේම ගෙඩියේ පිට පොත්තේ දැලක වැනි ස්වරූපය හොඳින් ඇතිවී තිබිය යුතුය. මෙවිට ගෙඩියේ පැහැයද ලා දුඹුරු හෝ කහ පැහැයකට හැරේ.

අතින් සෙමින් තද කිරීම මගින් ද, ඇඟිල්ලෙන් තට්ටු කිරීමෙන් ද පළපුරුදු වගා කරුවෙකු හට ගෙඩි මෝරා තිබේදැයි දැන ගත හැකිය.

ගෙඩි වර්ධනය වන විට පිදුරු වලින් මඳක් ආවරණය කර තබන්න. කපුටන් ගේ හානිය ද, තද හිරු එළිය නිසා ගෙඩියේ පැහැය වෙනස් වීමද මෙමඟින් වලකා ගත හැකිය.

වර්ධනය වන ගෙඩිය යටින්, වළල්ලක් ආකාරයට පිදුරු සකසා තබන්න. එසේ නැතහොත් වයුනක් ලෙස ගෙඩිය යට පිදුරු අතුරන්න. මෙමගින් ගෙඩියේ මඩ තැවරීමෙන් වර්ණය වෙනස් වීම හා රෝග වලට ගොදුරුවීම පාලනය කර ගත හැකිය.

## අස්වැන්න

හොඳින් නඩත්තු කළ අක්කරයක කොමඩු වගාවකින් මෙ.ටො. 15-20 පමණ අස්වැන්නක් ලබාගත හැකිය.

## වෙළඳපොල වෙත සැකසීම

විශාලත්වය අනුව ගෙඩි තෝරා ගන්න. පිදුරු අසුරා ඇති වාතාශ්‍රය හොඳින් ලැබෙන ලී පෙට්ටි වල අසුරා ප්‍රවාහනය කරන්න. මෙමගින් ගෙඩි වලට වන හානිය අඩු වේ.



## ගබඩා කිරීම

අප රටේ බහුලව වගා කරනු ලබන පත්තක්කා (කොමඩු) වර්ග සාමාන්‍ය පරිසර උෂ්ණත්වය යටතේ දින 14 ක් පමණ ගබඩා කර තබා ගත හැකිය. නමුත් "පැණි කොමඩු" වර්ග ගබඩා කළ යුත්තේ ශීත ගබඩාවලය.

අපනයනය සඳහා නිපදවනු ලබන ගෙඩි පළමුව සීතල වතුරෙන් සෝදා ඉක්මනින් සිසිල් වායුව පවතින ස්ථානයක ගබඩා කළවිට ගෙඩිවල පැවති උෂ්ණත්වය ක්‍රමයෙන් අඩු වේ. මෙම ගෙඩි කාඩ්බෝඩ් පෙට්ටි වල අසුරා අපනයනය කළ යුතුය.



## අපනයන වෙළඳපොළ

ශ්‍රී ලංකාවේ කොමඩු වර්ග සඳහා යුරෝපයේ සහ ජපානයේ සතුටුදායක ඉල්ලුමක් ඇත. 2004 වසරේ අප රටෙන් අපනයනය කරන ලද කොමඩු ප්‍රමාණය මෙ.ටොන් 5.7 පමණ වේ. මෙහි වටිනාකම රුපියල් ලක්ෂ හතක් පමණ

වේ. කොමඩු අපනයනය කරනු ලබන වෙනත් රටවල් සමග හැම විටම අපට තරග කළයුතුය. එනිසා විවිධ වෙළඳපොල වල අවශ්‍යතාවයට ගැලපෙන පරිදි කොමඩු නිපදවා සැපයීම කළ යුතුය. ඔවුනට විශේෂයෙන් අවශ්‍ය කාල වලදී ද සැපයීමට හැකි විය යුතුය.

## ශ්‍රම අවශ්‍යතාවය

කොමඩු අක්කරයක් ක්‍රමාණුකූලව වගා කිරීම සඳහා අවශ්‍ය ශ්‍රමය.

| කාර්යය | ශ්‍රම දින |
|---|---|
| ඉඩම් සැකසීම හා පස සංරක්ෂණය | 12 |
| වලවල් සලකුණු කිරීම හා කැපීම | 08 |
| කාබනික හා මූලික පොහොර යෙදීම | 04 |
| බීජ/පැළ සිටුවීම | 02 |
| පොහොර යෙදීම හා වල් මර්ධනය | 08 |
| ජල සම්පාදනය | 12 |
| වගා නඩත්තුව | 04 |
| අස්වනු නෙලීම | 10 |
| එකතුව | 60 |

## කෘෂි රසායනික ද්‍රව්‍ය හඳුනා ගන්න

මෙම ප්‍රකාශනයෙහි විවිධ කෘෂි රසායනික ද්‍රව්‍යයන් අදාල ස්ථානයන්හි සඳහන් කර ඇත්තේ ඒවායේ "පොදු නාම" වලිනි. ඔබගේ පහසුව සඳහා එකී පොදු නම් වලට අනුරූපිත නිෂ්පාදනවල වෙළඳ නම් පහත සඳහන් වේ.

| පොදු නාම | වෙළඳ නම් |
|---|---|
| බිටර්ටනෝල් 300g/l EC | බේකර් EC 300 |
| කැප්ටාන් 50% WP | කැප්ටාන් 50 WP, කැප්ටෆ් 50 WP, කැප්ටාන් |
| කාබෙන්ඩසිම් 50% WP/WG | කාර්බින්, කැනන්, වෙකුඩසිම් 50% WP, බුලට් 50, මැක්ඩසිම්, බිලට්, බවර්ස් කාබෙන්ඩසිම් කාබෙන්ඩසිම් 50 WP, බ්ලාස්ට් ඕල්, බැවිස්ටින්, ඩවුනි, හෝ ගාර්ඩ්, ෂුට් |
| කාබෙන්ඩසිම් 500 g/1 SC | බැවිස්ටින් FL |
| ක්ලෝරොතැලොනිල් 500 g /l SC | ඩැකොනිල් SC, රොනිල් |
| කොපර් 50% WP | චැම්පියන්, පෙරනොක්ස් |
| මැන්කොසෙබ් 80% WP | මැන්කොසෙබ් 80% WP, මැන්කෝල්, පොලිසේට්, ඩයනමික් 80, යුනිතේන්, බිලිටොක්ස්, සන්කොසෙබ්, මැන්සේට්, වොන්ඩොසෙබ්, පොලිසේට්, උතේන්, ඇග්‍රිතේන් M 45, ස්ටැෂ්, මාර්කෝ ඩයිනමික් 80, ශීල්ඩ්, ඇම්කොසෙබ්, ඩයිතේන් M 45, ඇග්ස්ටාර් මැන්කොසෙබ්, |
| මැනෙබ් 80% WP | මැනෙබ් 80 WP, පොලිරාම් M, සැනෙබ් WP 80%, මැනෙරාම් |
| ප්‍රොපිනෙබ් 70% WP | ඇන්ත්‍රකෝල් 70%WP |
| තිරාම් 80% WP | ෆින්කෙම් තිරාම්, පොමර්සෝල් ෆෝටේ WP 80%, ස්කෝප්, ඕපෙක්ස් තිරාම්, සිපෙට්කෝ තිරාම් |
| මැන්කොසෙබ් 64% + මෙටලැක්සිල් 8% } WP | යුනිලැක්ස්, රිඩොක්සිල්, රිඩොමිල් MZ 72 WP, උනිලැක්ස්, මෙටලැක්ස්, සන්ලැක්ස්, රිඩ්ඕල්, රිලැක්ස්, ඇග්‍රොසිල්, ඇග්ස්ටාර් රේන්ගාර්ඩ් 72, |
| තයෝෆනේට් මීතයිල් 70% WP | ටොප්සින් M 70, තයොෆෙන් M 70 |
| ප්‍රොපිනෙබ් 56% + ඔක්සඩික්සිල් 10% } WP | ෆ්‍රැවිට් WP 66% |
| ප්‍රොපිකොනසෝල් 250 g/1 EC | බම්පර්, ටිල්ට් |